# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2114/61 - 2019 මාර්තු මස 15 වැනි සිකුරාදා - 2019.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

ඇමුණුම 05

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 02

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* අංක 2050/41 හා 2017.12.22 දිනැති, *අති විශෙෂ ගැසට් පත්‍රය* මඟින් සංශෝධිත අංක 1898/5 හා 2015.01.19 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

1. 7 ඡේදයේ 7.3.2.1 කොටස පහත පරිදි සංශෝධනය විය යුතුය.

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය/අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුලුව විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

2. ඇමුණුම් 06 යටතේ අංක 02, අංක 04 හා අංක 05 කොටස්වල "විභාගය" යන්න වෙනුවට "කාර්යක්ෂමතා කඩඉම් විභාගය" ලෙස ආදේශ විය යුතුයි.

3. ඇමුණුම් 06 සඳහා අවසානයට අංක 06 ලෙස පහත කරුණු එක් කරනු ලැබේ.

6. බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් සඳහා රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු දැනුවත් වී සිටිය යුතු මූලික සිද්ධාන්ත අඩංගු දින 10කින් යුත් පහත පාඨමාලාව 1 **ශ්‍රේණියට උසස් වී වසර 05 ක් ඇතුළත** සාර්ථකව හදාරා නිම කිරීම මත 1 ශ්‍රේණියේ නිලධාරීන්ට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.


1A - PG 4429 - 42 (2019/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

i. පාඨමාලාව පවත්වන බලධරයා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරනු ලබන ආයතනයක්

ii. පාඨමාලාව පවත්වනු ලබන කාලසීමාව : 1 ශ්‍රේණියට නියමිත පුහුණු පාඨමාලාවට අදාළව ඉල්ලුම්පත් කැඳවීම සඳහා වූ නිවේදනය සෑම වර්ෂයකම මුල් කාර්තුවේ දී ප්‍රසිද්ධියට පත් කරනු ලබන අතර ඒ සඳහා ලැබෙන ඉල්ලුම්පත් ප්‍රමාණය සලකා බැලීමෙන් අනතුරුව වර්ෂයකට පවත්වන වාර ගණන තීරණය කරනු ලබයි.

iii පාඨමාලාවේ විෂය නිර්දේශය

| *මොඩියුලය* | *කාලය* |
|---|---|
| රාජ්‍ය සේවයේ විනය ක්‍රියාපටිපාටිය | දින 02 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හා වත්කම් කළමනාකරණය | දින 03 |
| සංවිධාන ඵලදායීත්වය | දින 02 |
| ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය | දින 02 |
| තොරතුරු දැන ගැනීමේ පනත හා පාරිභෝගික සත්කාරය | දින 01 |

*සටහන* :

01. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරනු ලබන ආයතනයක් මගින් පාඨමාලාව මෙහෙයවනු ලබන අතර අදාළ මොඩියුල පහම සාර්ථකව සම්පූර්ණ කිරීම මගින් පමණක් බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ 1 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කරනු ලැබේ.

02. තවද බස්නාහිර පළාත් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ 1 ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා ඉහත (01) කොටසින් දක්වා ඇති විභාගය සමත් වීම හෝ (06) කොටස මගින් දක්වා ඇති පාඨමාලාවේ විෂය නිර්දේශය යටතේ ඇති මොඩියුල 05ම සාර්ථකව සම්පූර්ණ කිරීම හැර විභාගයේ විෂයයන් හා පාඨමාලාවේ විෂයයන් ඒකාබද්ධ වූ විෂයෙන් විෂයට නිදහස් කිරීමේ පදනමක් මත කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමක් කිසිසේත් සිදු කරනු නොලැබේ.

බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගය පරිදි,

එම්. ජී. ඒ. තිලකරත්න,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2019 මාර්තු මස 07 වැනි දින,
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 109, මහ වීදිය,
බත්තරමුල්ල.

03 - 1488

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.